ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන

අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007

**ESP 1106** -අධ්‍යාපනයේ මාර්ගෝපදේශනය හා උපදේශනය

කාලය පැය තුනයි.

---

දිනය - 2007.11.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II වන කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I - කොටස

01. අධ්‍යාපනික මාර්ගෝපදේශය හා අධ්‍යාපනික උපදේශනය අතර ඇති වෙනස්කම් දෙකක් ලියන්න.

02. චයසීා සංස්කරණ න්‍යායට අනුව ගැටලු සහිත චර්යා විස්තර කරන්නේ කෙසේදැ'යි නිදසුනක් දක්වමින් පැහැදිලි කරන්න.

03. "පාසෝනියන් ආකෘතිය" කෙටියෙන් පැහැදිලි කරන්න.

04. සමායෝගය සමාජ ගැටලුවක් ද නැතහොත් අධ්‍යාපනික ගැටලුවක්දැ'යි යන්න පරීක්ෂා කරන්න.

05. සිසුන් තුළ සමායෝගී පෞරුෂ සංවර්ධනයෙහි ලා ගැටලු ඇති කළ හැකි ආයතනික ගැටලු දෙකක් විභාග කරන්න.

06. සමාජ නිශ්ක්‍රමණය හා සමාජ කුසලතා සංවර්ධනය අතර සබඳතාව කෙටියෙන් පැහැදිලි කරන්න.

07. උපදේශන න්‍යායයකින් උපදේශකයාට ලබා ගත හැකි වාසි තුනක් දක්වන්න.

08. අංග විකල ළමයින්ට සහායවීම සඳහා ගුරුවරයෙකුට පන්ති කාමරයේ යොදාගත හැකි ක්‍රියාමාර්ග පහක් සඳහන් කරන්න.

(5 x 8 = 40 ලකුණු)

## II - කොටස

09. I. ශ්‍රී ලංකාවේ උපදේශන සේවා ඉතිහාසය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

II. ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන දෙකක් තෝරා එම උපදේශන සේවාවන්හි ඵලදායිත්වය විභාග කරන්න. (ලකුණු 12)

10. I. ළමයින් තුළ පවතින්නේ යයි ඔබ සිතන චර්යා ගැටලු පහක් ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

II. ද්විතියික පාසල් සිසුන්ගේ චර්යා ගැටලුවලට බලපාන හේතු මොනවා ද? (ලකුණු 05)

III. ඔබ ඉහත දැක්වූ ලැයිස්තුවෙන් ගැටලුවක් තෝරා එය විසඳා ගැනීමට ළමයෙකුට සහය විය හැකි ආකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

11. I. ජීවන ක්ලමථවල ස්වභාවය විභාග කරන්න. (ලකුණු 05)

II. ජීවන ක්ලමථ ඇසුරු කරගත් සාධක විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

III. ගුරුවරයෙක් ලෙස ජීවන ක්ලමථවල බලපෑමට ලක් වූ සිසුවකුට සහාය වියහැකි අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. "වත්මන් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ උපදේශන සේවාව ශිෂ්‍යයාට පමණක් නොව ගුරුවරයාට ද වැදගත් ලෙස සැලකිය හැකිය."

මෙම ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 20)

13. I. පාසල් පද්ධතිය තුළ මාර්ගෝපදේශය හා උපදේශනයට අදාල මග පෙන්වීම් මොනවාද ? (ලකුණු 10)

II. එම මග පෙන්වීම්වලින් ඕනෑම මගපෙන්වීමක් තෝරා එය පාසල් පද්ධතිය තුළ මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක සාර්ථකත්වය සඳහා දායක වන අන්දම පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. පහත සඳහන් ඕනෑම මාතෘකාවලින් දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

I. ඉගෙනුම් දුෂ්කරතාව
II. කාල් රොජර්ස්
III. පාසල්වල වෘත්තීය උපදේශනයේ අවශ්‍යතාව
IV. අසමත්වීමේ චක්‍රය

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -